*සැ. යු.*– 2007.06.29 දින පළවූ අංක 1,504 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොකරන ලදී.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,505- 2007 ජූලි 06 වැනි සිකුරාදා - 2007.07.06**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 640 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 645 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 649 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


*සැ. යු.*–(i) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත කෙටුම්පත 2007 මැයි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 ජුනි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) සමන්තුරේ තබ්ලීකුල් ඉස්ලාම් අරාබි විද්‍යාලය (සංස්ථාපිත කිරීමේ) පනත් කෙටුම්පත 2007 මැයි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජූලි මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ජුනි මස 29 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 244

DRF/RECT/580(IV)AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ මරණින් පසු නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ.

(අ) මේජර් තුවාන් නිසාම් මුතාලිෆ් සබුබ

(1) 2005 මැයි මස 01 වන දින සිට මරණයෙන් පසු ලුතිනන් කර්නල් නිලයට උසස් කිරීම

(2) 2005 මැයි මස 31 වන දින සිට මරණයෙන් පසු කර්නල් නිලයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අප්‍රේල් මස 19 වන දින.

07-34/1

---

2007 අංක 245

DRF/RECT/580(IV)AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් හා මරණින් පසු උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරිගේ නිලය ස්ථිර කිරීම/මරණයෙන් පසු උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ.

(අ) කපිතන් (තාවකාලික මේජර්) බෙන්තොට හේවගේ පර්සි ජගත් ගැහේබ

(1) 2006 අප්‍රේල් මස 22 දින සිට මේජර් නිලය ස්ථිර කිරීම

(2) 2006 අප්‍රේල් මස 22 දින සිට මරණයෙන් පසු ලුතිනන් කර්නල් නිලයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 09 දින,
කොළඹ දී ය.

07-34/3

---

2007 අංක 246

DRF/RECT/580/(IV)AY

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද මරණින් පසු නිල උසස් කිරීමක්

1. පහත නම සඳහන් නිලධාරිගේ මරණයෙන් පසු නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර තිබේ :

(අ) නි/65120 කපිතන් කරුණාතිලක මුදියන්සේලාගේ චමින්ද බණ්ඩාර කරුණාතිලක කරෙ

(1) 2006 ජූලි මස 31 දින සිට මරණයෙන් පසු මේජර් නිලයට උසස් කිරීම

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ දී ය.

07-34/2

2007 අංක 247

DRF/21/RECT/2365.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

නිල ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරි 2006 අප්‍රේල් මස 06 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/60901 කපිතන් (තාවකාලික මේජර්) ගමරාලලාගේ සුනිල් ආරියසේන ආර්එස්පි ගරෙ.

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2006 අප්‍රේල් මස 07 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

නි/60901 මේජර් ගමරාලලාගේ සුනිල් ආරියසේන ආර්එස්පී ගරෙ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පි පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

07-40

2007 අංක 248

DRF/21/RECT/2369.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

නිල ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 ජුනි මස 30 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/60671 කපිතන් (තාවකාලික මේජර්) ජානක එදිරිසිංහ ආර්එස්පී ශ්‍රීලපාහ

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 01 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/60671 මේජර් ජානක එදිරිසිංහ ආර්එස්පී ශ්‍රීලපාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජූලි මස 31 වැනි දින,
කොළඹ දී ය.

07-41

2007 අංක 249

DRF/21/RECT/2368

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

නිල ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරි 2006 ජුනි මස 30 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61052 කපිතන් (තාවකාලික මේජර්) කපිල ශ්‍රී රවින්ද්‍ර කන්දෙ විදානරාළගේ ආර්එස්පි ශ්‍රීලයුපොදුසේබ

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 01 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61052 මේජර් කපිල ශ්‍රී රවින්ද්‍ර කන්දෙ විදානරාළගේ ආර්එස්පී ශ්‍රීලයුපොදුසේබ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පි පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

07-42

2007 අංක 250

DRF/21/RECT/2367.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

විශ්‍රාම ගැනිම

පහත නම සඳහන් නිලධාරියා 2006 අගෝස්තු මස 04 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/60965 මේජර් වෙල්ලප්පිලි විජේරත්නලාගේ රියන්සි දයානාත් විජේරත්න ආර්එස්පී ශ්‍රීලපාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

07-36

---

2007 අංක 251

DRF/21/RECT/2350.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/62814 කපිතන් ලක්මාල් ප්‍රියශාන්ත බලගල්ල ආර්ඩබ්පී ආර්එස්පී ශ්‍රීලකාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ජුනි මස 02 වැනි දින,
කොළඹ දී ය.

07-39

2007 අංක 252

DRF/21/RECT/2370

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

විශ්‍රාම ගැනිම

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 04 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/62650 කපිතන් (උපකරණ පාලක) ජයසිංහ ආරච්චිගේ පද්මසිරි ශ්‍රීලවියාඉ

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 04 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/62650 කපිතන් (උපකරණ පාලක) ජයසිංහ ආරච්චිගේ පද්මසිරි ශ්‍රීලවියාඉ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

07-31

---

2007 අංක 253

DRF/21/RECT//2373.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

විශ්‍රාම ගැනිම

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතාන් හර්ෂ සඳමාල් වීරසූරිය, ශ්‍රීලයුපොහේබ (නි/62922)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 07 වැනි දින,
කොළඹ දී ය.

07-38

---

2007 අංක 254

DRF/21/RECT/2366.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය(පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 23 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/62400 කපිතාන් (උපකරණ පාලක) පේලි කංකානමලාගේ සිරිපාල, ශ්‍රීලපාහ

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය(පොදු) උපසේවයට මාරු කිරීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 23 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/62400 කපිතාන් (උපකරණ පාලක) පේලි කංකානමලාගේ සිරිපාල, ශ්‍රීලපාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

07-32

2007 අංක 255

DRF/21/RECT/2372.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව – ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරියා 2006 අගෝස්තු මස 03 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61190 කපිතාන් (උපකරණ පාලක) අබේසේකර හෙට්ටිගේ හෙන්රි, ගැහේබ

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය(පොදු) උපසේවයට මාරු කිරීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 අගෝස්තු මස 03 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය(පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/61190 කපිතාන් (උපකරණ පාලක) අබේසේකර හෙට්ටිගේ හෙන්රි, ගැහේබ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

07-33

---

2007 අංක 256

DRF/21/RECT/2364.

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අනිවාර්යය විශ්‍රාම ගැන්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2006 ජුනි මස 01 වන දින සිට අනිවාර්යය විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/64443 ලුතිනන් බොලපේ හේරත් මුදියන්සේලාගේ බුද්ධික චමින්ද ධර්මකීර්ති, ඉසේබ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

07-37

---

DRF/21/RECT/2376.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අපකීර්ති සහගත ලෙස යුද හමුදා සේවයෙන් පහ කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2006 ජුනි මස 30 වන දින සිට අපකීර්ති සහගත ලෙස යුද හමුදා සේවයෙන් පහ කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/63506 ලුතිනන් වටරක ගමගේ අවින්ද්‍ර මාධව නරේන්ද්‍රසිරි, ශ්‍රීලකාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

07-43

---

DRF/21/RECT/2371.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2006 ජුනි මස 30 වන දින සිට අධිකාරියෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/64664 ලුතිනන් මනික්කු වඩු වාරුක නිරංජන විමලසූරිය, ශ්‍රීලයුසේබ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

07-44

---

2007 අංක 257

DRF/21/RECT/30/AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක් සහ පත් කිරීමක්

#### නිල උසස් කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2006 අගෝස්තු මස 26 දින සිට මේජර් ජෙනරාල් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/1956 බ්‍රිගේඩියර් වරකාපිටිය අබේකෝන්ගේ දොන් සුනිල් සිල්වා

#### පත්කිරීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2006 අගෝස්තු මස 26 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා සෙවේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක තනතුරට පත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/1956 මේජර් ජෙනරාල් වරකාපිටිය අබේකොන්ගේ දොන් සුනිල් සිල්වා

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

07-45/2

2007 අංක 258

DRF/21/RECT/30/AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2006 මැයි 26 වැනි දින සිට තාවකාලික බ්‍රිගේඩියර් නිලයට උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත :

කර්නල් විදානෙලාගේ හානි සොයිසා (නි/2069)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

07-45/1

2007 අංක 259

DVF/RECT/261.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්

පහත නම සඳහන් නිලධාරි 2006 මාර්තු මස 21 දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/4675 ලුතිනන් වික්ටර් විනෝද් හේවා, ගැහේබ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි.

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජූලි මස 31 දින,
කොළඹ දී ය.

07-35

# ආණ්ඩුවේ නිවේදන

## 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (2) (අ) වගන්තිය යටතේ නියමය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (2) (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, රංජිත් සියඹලාපිටිය වන මම මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් ආයතනය එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

රංජිත් සියඹලාපිටිය,
*වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.*

2007 ජූනි මස 14 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

"කොමර්ෂල් බැංකු සමාජ වගකීම් භාරයේ උසස් අධ්‍යාපනය සඳහා වූ ශිෂ්‍යත්ව අරමුදල"

07-70

## 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (2) (අ) වගන්තිය යටතේ නියමය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 (2) (අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, රංජිත් සියඹලාපිටිය වන මම මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් ආයතනය එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

රංජිත් සියඹලාපිටිය,
*වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.*

2007 ජූනි මස 15 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

උපලේඛනය

" ආර්ක් එන් සියල් (දේදුනු) ආයතනයේ දිළිඳු දරුවන් සුරැකුම් අරමුදල"

07-71

## විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව එල්. කේ. රත්නසිරි නමැති, ශ්‍රී ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එල්. කේ. රත්නසිරි,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 ජුනි මස 06 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලය,
කොළඹ 11.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1401 | 2007.05.15 | බැප්ටිස්ට් දේවස්ථානය | කැකිරාව | ජේ. ආර්. කොස්තා දේවගැතිතුමා | ක්‍රිස්තියානි (බැප්ටිස්ට් සභාව) |

07-84

---

එල්.ඩී.බී. 277/40

## පුරාවස්තු ආඥාපනත

(188 වන අධිකාරය වන) පුරාවස්තු ආඥාපනතේ 18 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයා විසින් පනවනු ලබන ආඥාවයි.

අනුර බණ්ඩාරනායක,
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2007 මැයි මස 08 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් පුරාණ ස්මාරක (188 වන අධිකාරිය වන) පුරාවස්තු ආඥාපනතේ කාර්යයන් සඳහා ආරක්ෂිත ස්මාරක වශයෙන් මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

### උපලේඛනය

### ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන ස්මාරක වල ලැයිස්තුව

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දේමැදගම ග්‍රාම නිලධාරි වසමේ, කඳුබොඩ ග්‍රාමයේ පිහිටි නිකසලා ආරණ්‍ය සේනාසන භූමියට අයත් ලෙන් ලිපිය සහිත කටාරම් කොටු ලෙන සහ පැරණි පොකුණු දෙක,

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හිරිපොකුණ ග්‍රාම නිලධාරි වසමේ, නිකපිටිය ග්‍රාමයේ පිහිටි පන්සල්හේනවත්ත ඉඩමට අයත් පැරණි දාගැබ් ගොඩැල්ල, පෝය ගෙය සහ ගල්කුළුණු සහිත භූමිය,

3. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුණිහිරිගම ග්‍රාම නිලධාරි වසමේ, ගල්කන්ද ග්‍රාමයේ පිහිටි වෙහෙරගල විහාරස්ථාන භූමියට අයත් දාගැබ් ගොඩැල්ල, පැරණි ගොඩනැගිලි දෙක සහ පොකුණ,

4. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දේමැදගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කන්දේ මැදගම මහා චෛතියගිරි විහාර භූමියට අයත් දාගැබ, බෝධිඝරය, සංකර්ෂිත ගොඩනැගිලි දෙක, කටාරම් සහිත ලෙන් විහාරය, ලෙන් ලිපිය සහිත ලෙන සහ අවට විසිරී ඇති පුරාවිද්‍යාත්මක අවශේෂ,

5. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දේමැදගම ග්‍රාම නිලධාරි වසමේ, මැදගම කන්දේ පිහිටි විජය සොහොන,

6. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හෙට්ටිපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බමුණුමුල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බමුණුමුල්ල බතලගොඩ වැව ඉස්මත්තේ ඇති දාගැබ් ගොඩැල්ල සහ ටැම්පිට විහාරයට අයත් අවශේෂ,

7. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මළගනේ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි වළගම්බා පුරාණ විහාර භූමියට අයත් කටාරම් සහිත ලොන් විහාරය සහ පැරණි ප්‍රාකාරය,

8. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, නුවර කන්ද පුරාණ විහාර භූමියට අයත් පැරණි චෛත්‍යය පාදම, ආසනඝරය, පැරණි සෙල්ලිපි, බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් සහ ලෙන් විහාරය,

9. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 604 නහල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි නහල්ල පැරණි අම්බලම,

10. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 604 නහල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පොල්කුඹුර සාගල්ලිපුර පුරාණ විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් 05, පර්වත ලිපිය සහ ගල්කණු,

11. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 569 දෙල්විට ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දෙල්විට පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය,

12. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පානගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පානගමුව බාඹරුව පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය සහ කටාරම් කෙටූ ලෙන් තුන

13. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගනේගොඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වේරගොඩ පුරාණ විහාර භූමියට අයත් චෛත්‍යය ගොඩැල්ල සහ ගල්කණු

14. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහල ඕගොඩපොල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි විල්ගම්වෙහෙර පුරාණ විහාර භූමියට අයත් චෛත්‍යය ගොඩැල්ල, ගල්කණු, ශිලාලිපිය සහ ගල් පර්වතයේ කොටා ඇති පියගැටපෙල

15. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 586 මහවෙල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පාදෙනිය ග්‍රාමයේ පිහිටි විල්ගම්වෙහෙර, පුරාණ විහාර භූමියට අයත් ශිලා ලිපිය, පැරණි දාගැබ හා ඒ අවට විසිරී ඇති පුරාවිද්‍යාත්මක අවශේෂ

16. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 624 අක්කර පනහ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අලවල ග්‍රාමයට අයත් අලවල ශිලා ලිපිය.

17. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 603 රම්බඩගල්ල ග්‍රාමයේ පිහිටි පෙත්මගයාය පුරාවිද්‍යා ස්ථානයට අයත් ශිලාලේඛන හතර සහ කටාරම් සහිත ලෙන් 5 ඇතුළු අනෙකුත් පුරාවස්තු

18. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 601 ඕගොඩපොල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොට්ටංග ගමට අයත් කොට්ටංග ශිලාලිපිය

19. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 539 කොටුහේන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ශ්‍රී විශුද්ධාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි ස්තූපය සහ ගොඩනැගිලි නටබුන්

20. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වතුවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වතුවත්ත ශ්‍රී සුනන්දාරාම විහාර භූමිය තුළ පිහිටා ඇති ටැම්පිට විහාරය සහ පෝය සීමා තුළ ඇති දාගැබ

21. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හොරවඩුන්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හොරවඩුන්න ශ්‍රී සුදර්ශන ශෛලබිම්බාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.

22. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුපොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්සව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කුඹුක්වැව ශ්‍රී නාගරුක්ඛාරාම විහාර භූමියට අයත් ටැම්පිට විහාරය

23. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 489 දොළුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දොළුව රංකිරිමඩ රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන, දික්ගෙය පිහිටි ගලෙහි කෙටූ සිරිපතුල, ලෙන් ලිපිය සහිත ලෙන

24. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බණ්ඩාරගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බණ්ඩාරවෙල, බෝගහමුල්ලවත්ත කළුගල නමැති ස්ථානයේ ඇති ශිලාලේඛනය, කණු පාදම්ගල් ගොඩනැගිලි අවශේෂ, ගල්කණු සහ පැරණි චෛත්‍යය.

25. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සාලියගම පළාත අංක 343 ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මංගලාරාම ගනේකන්ද රජමහා විහාර භූමියට අයත් මහනුවර යුගයේ සිතුවම් සහිත ප්‍රතිමා ගෘහය, කටාරම් සහ ශිලාලේඛන සහිත සියලුම ලෙන්, පර්වතයේ කොටා ඇති සිරිපතුල්ගල, ගල්කුළුණු සහ දාගැබ.

26. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔග්ගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කළුගල්ල ග්‍රාමයේ පිහිටි ශ්‍රී නීලගිරි රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන, පර්වත මුදුනේ ඇති චෛත්‍යය නටබුන් සහ භූමියේ විසිරී ඇති වෙනත් පුරාවිද්‍යාත්මක නටබුන්

27. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 267 ග්‍රාම නිලධාරී වසමේ හේනේගෙදර ග්‍රාමයේ ලොට් අංක 80 දරන කළුගල සහිත ප්‍රදේශයේ පිහිටි කටාරම් සහිත ලෙන සහ දැගැබ් ගොඩැල්ල

28. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 166 කෝන්වැව වදකහගල පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය

29. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 206 පොතුවැව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගුරුගොඩ ග්‍රාමයේ පිහිටි ශ්‍රී ශාක්‍යමුණි විහාර භූමියට අයත් ඉපැරණි ගල්කණු සහිත නටබුන් ප්‍රදේශය.

30. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 138 කට්ටඹුවාව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දියගැඹේ පුරාණ විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය සහ ලෙන, සෙල්ලිපි 02, ගිරිලිපි 04 සහ වැව

31. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 524 මහවැව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මහවැව නාගාරාම පුරාණ විහාර භූමියට අයත් ටැම්පිට විහාරය

32. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජවීදිය ග්‍රාමයේ පිහිටි බ්‍රිතාන්‍ය පාලන සමයට අයත් පරිපාලන නිලධාරීන්ගේ නිල නිවාසය

33. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේපොල උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වෙළුවනාරාම පුරාණ විහාර භූමියේ පිහිටා ඇති ප්‍රතිමා ගෘහය සහ අටුව

34. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ,නාගොල්ල ග්‍රාම නිලධාරී වසමට අයත් පැරණි පිංතාලිය

35. මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොට්ටල ග්‍රාම නිලධාරී වසමට අයත් ශුද්ධ වූ එමානුවෙල් දෙව්මැදුර

36. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩවෙල, උඩගම නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හන්තාන රජමහා විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය සහ අවාස ගෙය

37. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩුගන්නාව ග්‍රාම නිලධාරී වසමේ කඩුගන්නාව නගරයේ පිහිටා ඇති ඓතිහාසික ඩෝසන් කුළුණ

38. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 432 ග්‍රාම නිලධාරී වසමේ ඇත්විල්වත්ත නමැති ඉඩමේ පිහිටා ඇති සීතා ලෙන නමින් හඳුන්වන කටාරම් කෙටු ගල්ලෙන

39. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හේන්පිට ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඇඹුල්ගම රජමහා විහාර භූමියට අයත් උඩමළුවේ පිහිටි කටාරම් සහිත ගල්ලෙන් දෙක සහ පහත මළුවේ පිහිටා ඇති පැරණි ආවාස ගෙය

40. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරගල ග්‍රාම නිලධාරී වසමේ කුරගල කන්දේ ඇති ප්‍රාග් ඓතිහාසික මානව ජනාවාස සාධක සහිත ස්වාභාවික ලෙන

41. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මැද කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාළිගාවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාළිගාවත්ත මුස්ලිම් සුසාන භූමියේ ඇති හුසෙන් ලෙබ්බේ නැමැත්තාගේ සුසානය, මස්තාන් මවුලානා නැමැත්තාගේ සොහොන් ගෙය සහ අෂ්ඨාකාර සොහොන් ගෙය

42. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බාන්ස් ප්‍රදේශයේ පිහිටි බාන්ස් හෝල් ඉඩමට අයත් පැරණි නිවස.

43. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 817/ඒ, පහල කුඩලිගම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බුලත්වතුකන්ද නැමැති කන්දේ ගල්තලාවක් මත පිහිටා ඇති පාදම් කණු වලවල් සහිත ගොඩනැගිලි අවශේෂ ස්ථානය.

44. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හල්වල කදු මුදුනේ පිහිටා ඇති පවුරේ කන්ද පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.

45. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගිරිකුළුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ශ්‍රී සුබෝධාරාම පුරාණ විහාර භූමියට අයත් ප්‍රතිමා ගෘහය.

46. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සමනබැද්ද 416ඒ ග්‍රාම නිලධාරී වසමේ සමනබැද්ද ගමේ පිහිටි ගනේඋඩ රජමහා විහාර භූමියට අයත් කටාරම් සහිත ගල්ලෙන්, පොකුණ, පඩිපෙල සහ ශිලාලිපි.

47. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ඕකේවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හීනටිගහමුන ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොට්ටඹ ශ්‍රී සුභද්‍රාරාම විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.

48. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩේ වීදිය නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අනගාරික ධර්මපාල මාවතෙහි වරිපනම් අංක 26 දරන ස්ථානයේ ඇති පැරණි නිවස (ආරච්චි වලව්ව)

49. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උයන්වත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාතර තාරකා කොටුව ආසන්නයේ ඇති පැරණි ප්‍රාකාරය සහ වෙඩිබෙහෙත් ගබඩාව.

50. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 433 සී, ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දෙවිනුවර සිංහාසන මාවතේ වරිපනම් අංක 40 දරන පී. එම්. කනකරත්න ද සිල්වා මහතාට අයත් පැරණි නිවස (රේන්ද ගෙදර)

51. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පලල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වැලිගම කෝවිලකන්ද පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය.

52. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 25, මධ්‍යම ඇල්පිටිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගනේගොඩ රජමහා විහාර භූමියේ පිහිටා ඇති ප්‍රතිමා ගෘහය, ධර්ම ශාලාව චෛත්‍යය පොකුණ සහ ශිලාකුළුණ.

53. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොන්ස්විටා 137බී, ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රුමස්සල පැරණි කුළුණ.

54. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වවුලාගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගෝනාපීනුවල ශ්‍රී ශෛලකූඨාරාම පුරාණ ගල්ලෙන් විහාර භූමියට අයත් කටාරම් සහිත ලෙන් විහාරය සහ පැරණි චෛත්‍යය.

55. දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කතළුව නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කතළුව අටදාගේ වලව්ව හා ප්‍රාකාරය.

56. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්නපුර නගර බටහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රත්නපුර බණ්ඩාරනායක මාවතේ වරිපනම් අංක 4 දරන ස්ථානයේ ඇති පැරණි ගොඩනැගිල්ල.

57. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්නපුර නගර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ප්‍රැන්ක් හෙට්ටිආරච්චි මාවතේ වරිපනම් අංක 1/1 දරන ස්ථානයේ ඇති පැරණි ගොඩනැගිල්ල.

58. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රත්නපුර නගර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි රත්නපුර ඕලන්ද කොටුව තුළ පිහිටා ඇති වරිපනම් අංක 58/1 දරන ස්ථානයේ ඇති පැරණි ගොඩනැගිල්ල.

59. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙරළුප ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දේවාලේගාව ගල්කඩුව පුරාණ ගල්ලෙන් විහාරය.

60. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝන්ගස්මංකඩ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වැලිපත පුහුල්යාය පුරාණ ගල්ලෙන් විහාර භූමියට අයත් (විදර්ශන ගල්ලෙන් විහාරය) බ්‍රාහ්මී අක්ෂර සහිත කටාරම් කොටන ලද ගල්ලෙන.

61. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දියවින්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගනේෆන්දගම දියවින්න දේවගිරි පුරාණ ගල්ලෙන් විහාර භූමියට අයත් පැරණි ලෙන් විහාරය සහ කටාරම් කෙටු ලෙන් දෙක.

62. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහවලතැන්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මහවලතැන්න ශ්‍රී චන්ද්‍රසේකර මුදලින්දාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි ප්‍රතිමා ගෘහය සහ හේවිසි මණ්ඩපය.

63. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩුවන්වල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දෙදරන්ගමුව ග්‍රාමයට අයත් මඩුවන්වල පරපුරේ සොහොන් භූමිය.

64. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩුවන්වල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දික්වෙලේගොඩ ග්‍රාමයට අයත් පැරණි දාගැබ.

65. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොළොන්න ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කොළොන්න පුරාණ විහාර භූමියට අයත් (අත්තඨාරාම පුරාණ විහාරය)පැරණි බුද්ධ ප්‍රතිමාව.

66. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 210 දාපනේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දාපනේ ශ්‍රී ජයසුන්දරාරාම රජමහා විහාර භූමියට අයත් ටැම්පිට විහාරය.

67. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 208 කඹුරුගමුව ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හල්වින්න ශ්‍රී ජයමහා විහාර භූමියට අයත් පැරණි විහාර මන්දිරය

68. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කපුහේන්තොට ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පනාවැන්න අභයතිලකාරාම පුරාණ විහාර භූමියට අයත් පැරණි චිත්‍ර මූර්ති සහිත ප්‍රතිමා ගෘහය සහ ප්‍රාකාරය.

69. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාකඳුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මාකඳුර පුරාණ විහාර භූමියට අයත් පැරණි චිත්‍ර සහ මූර්ති සහිත ප්‍රතිමා ගෘහය, ආවාස ගෙය සහ ප්‍රාකාරය.

70. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිඟුල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හිඟුල රජමහා විහාර භූමියට අයත් ටැම්පිට විහාරය.

71. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පූනාගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බ්‍රෝටන් වතුයායේ ඉදිකර ඇති බ්‍රෝටන් බංගලාව, ගවමඩුව හා කාර්යාල ගොඩනැගිල්ල.

72. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උණුවතුර බුබුල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි වෙහෙරගල ග්‍රාමයට අයත් කටාරම් සහිත ලෙන් සමූහය, පර්වත ලිපිය, පැරණි ස්ථූප ගොඩැල්ල.

73. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 87, ගෝතමී පුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ගෝතමී පුර ග්‍රාමයේ ගෝතමී විහාර භූමියට අයත් පැරණි චිත්‍ර මූර්ති සහිත විහාර ගෙය.

07-86

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සීමාසහිත සෙලාන් බැංකුව-ජාඇල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 මාර්තු මස 05 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0270-747377-001.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. සී. රණවීර විසින් සහතික කරන ලද 1997 නොවැම්බර් මස 24 දිනැති අංක 3051 සහ 1997 දෙසැම්බර් මස 01 දිනැති අංක 3058 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 12 ලියාපදිංචි එන්(පීවීඑස්) 9296 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ජනරජය තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන උපාලි ගාමන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙසීය විසින් අටලක්ෂ හැට හතර දහස් තුන්සිය අනූහතරයි ශත පනස් දෙකක (රු. 2,28,64,394.52) මුදලක් 2006 ජූලි මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 2,28,64,394.52 මුදල ද, 2006 අගෝස්තු මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 3051 සහ 3058 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව තුළ නිව් බසාර් කොට්ඨාශ අංක 12 පිහිටි (කලින් ශ්‍රී සංඝරාජ මාවත නමින් හඳුන්වනු ලැබූ) ශ්‍රී සුමනතිස්ස මාවත කැබලි අංක : එක්ස් ලකුණු කළ වරිපනම් අංක 568/25 (කොටසක්) දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ග්‍රෑන්ඩ්පාස් පාර වරිපනම් අංක ජී98 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : ග්‍රෑන්ඩ්පාස් පාර වරිපනම් අංක 104 දරන පරිශ්‍රය ද, දකුණට : ශ්‍රී සුමණතිස්ස මාවතේ සිට කැබලි අංක එච් දරන (අඩි 40ක් පළල) පුද්ගලික පාර සහ බස්නාහිරට : ජීඊ කැබැල්ල යන මායිම් තුළ බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1988.07.30 දිනැති අංක 2097 දරන සැලැස්ම අනුව පර්චස් විස්සයි දශම තුනයි හයක් (අ. 0. රූ. 0, පර්. 20.36) විශාල එහි පිහිටි ගොඩනැගිලි, වගා සමඟ ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව ඒ 943/49, 50 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොඩිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -නීති.

07-66

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1900000726.

ණයකරුගේ සම්පූර්ණ නම : අසනා මරික්කාර් මොහොම්මදු ලාහීර්.

කටුනේරිය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. එච්. දාබරේරා විසින් ලියා සහතික කරන ලද අංක 123 හා 1997.06.10 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධිත) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තිස්පන් දහස් හාරසිය දාහතයි ශත හතලිස් නමයක (රු. 35,417.49) ක මුදලක් වර්ෂ 2004.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තිස්දහස් දෙසීය අනූදෙකයි ශත අටක් (රු. 30,292.08) මුදල ද වර්ෂ 2004.01.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් පන් දහස් එකසිය විසිපහයි ශත හතලිස් එකක් (රු. 5,125.41) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තිස්පන් දහස් හාරසිය දාහතයි ශත හතලිස් නමයක (රු. 35,417.49) ද,

(2) එකී රුපියල් තිස්දහස් දෙසීය අනූදෙකයි ශත අටක (රු. 30,292.08) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2004.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004ක් වූ මාර්තු මස 30 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පණ්ඩිත පත්තුවේ, කුමාර වන්නි පළාතේ, ආනමඩුව පුත්තලම ලියාපදිංචි කොට්ඨාශයේ ආනමඩුව ප්‍රාදේශීය සභාවේ තට්ටේව ග්‍රාමයේ පලුගහහේන නැමැති ඉඩමට 1986.01.30 දින ඒ. ඊ. විජේසූරිය මානක තැන විසින් මැන සම්පාදිත අංක 2455 පිඹුර ප්‍රකාර ලොට් 27, උතුරට : එම පිඹුරේම ලොට් 28 ද, නැගෙනහිරට : සියඹලාගහ ද, දකුණට : එම පිඹුරේම ලොට් 26 ද සහ බස්නාහිරට : එම පිඹුරේම ලොට් 40 (මාර්ග රක්ෂිතය) පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එස් 49/29හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-119

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 19/0/00/01755.

ණයකරුගේ සම්පූර්ණ නම : තෙබුවනගේ ජයලත් කුසුමාවතී.

කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එම්. පී. එල්. වඩුගෙදර විසින් ලියා සහතික කරන ලද අංක 2229 හා 1999.10.01 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධිත) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් අසූඑක්දහස් හයසිය තිස්අටයි ශත අනූඑකක (රු. 81,638.91) ක මුදලක් වර්ෂ 2003.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑදහස් දෙසීය දාහතරයි ශත තිස්දෙකක (රු. 70,214.32) මුදල ද වර්ෂ 2003.12.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් එකොලොස් දහස් හාරසිය විසිහතරයි ශත පනස්නමයක (රු. 11,424.59) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අසූඑක්දහස් හයසිය තිස්අටයි ශත අනූඑකක් (රු. 81,638.91) ද,

(2) එකී රුපියල් හැත්තෑදහස් දෙසීය දාහතරයි ශත තිස්දෙකක (රු. 70,214.32) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.5% බැගින් වන පොළියක් 2004.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. අයි. ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004 ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත් පත්තුවේ, යාගම් පත්තු කෝරළේ, බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාවේ (දුම්මලසූරිය උප කාර්යාලයේ) සියඹලාගස්රුප්ප ග්‍රාමයෙහි පිහිටි මහලක්ෂ්මී වතුයාය හෙවත් මඩවලගාර වත්ත නමැති ඉඩමට 1998.11.05 දින ඒ. ඒ. විමලසේන මානක තැන විසින් මැන සම්පාදිත අංක 1899 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට : වෛද්‍ය ටී නාගේන්ද්‍ර සහ අනික් අයට අයත් ඉඩම ද, නැගෙනහිරට : පිඹුරු අංක 581ඒ හි ලොට් 19 ද, දකුණට : පිඹුරු අංක 581ඒ හි අඩි 16 පළල පාර සඳහා වෙන් කරන ලද ලොට් 13 ද, බස්නාහිරට : පිඹුරු අංක 581ඒ හි ලොට් 17 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 48/220හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-118

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0135500191 සහ 0130000097.

ණයකරුගේ සම්පූර්ණ නම : විජේසූරිය ආරච්චිගේ දොන් අරෝෂ.

කොළඹ, හෝමාගම ප්‍රසිද්ධ නොතාරිස් ටී. ඩී. රණසිංහ සහ ඒ. එම්. ඩබ්. ජයතිලක විසින් ලියා සහතික කරන ලද අංක 2009, 2776 හා 2003.12.02, 2002.01.23 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ හතලිස් දෙදහස් නමසිය හැත්තෑපහයි ශත හැටහතක (රු. 4,42,975.67) ක මුදලක් වර්ෂ 2006.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හාරලක්ෂ පන්දහස් එකසිය පනස්තුනයි ශත දෙකක (රු. 4,05,153.02) මුදල ද වර්ෂ 2006.04.30 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් තිස්හත්දහස් අටසිය විසිදෙකයි ශත හැටපහක් (රු. 37,822.65) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හාරලක්ෂ හතලිස් දෙදහස් නමසිය හැත්තෑපහයි ශත හැටහතක් (රු. 4,42,975.67) ද,

(2) එකී රුපියල් හාරලක්ෂ පන්දහස් එකසිය පනස්තුනයි ශත දෙකක (රු. 4,05,153.02) මුදල මත අයවිය යුතු වර්ෂයකට 9.50%, 15.90% බැගින් වන පොලියක් 2006.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006 ක් වූ ජුනි මස 12 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලෙ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවේ, වැලිකඩ ග්‍රාමයෙහි උද්‍යාන පටුමගෙහි වරිපනම් අංක 11/12හි පිහිටි ඉඩමට 2001.01.22 දින ජී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් මැන සම්පාදිත අංක 1889 පිඹුර ප්‍රකාර ලොට් ඒට මායිම්, උතුරට : උද්‍යාන පටුමහෙහි වරිපනම් අංක 15/11 (පිඹුරු අංක 1261හි ලොට් 1හි දැක්වෙන දේපළ) ද, නැගෙනහිරට : උද්‍යාන පටුමගෙහි වරිපනම් අංක 27හි දැක්වෙන දේපළ ද, දකුණට : උද්‍යාන පටුමඟ ද, බස්නාහිරට : පාර (අඩි දොළහක් පළල) ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 5.50) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමඟ ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1580/31හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

07-122

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කළ සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1905500108.

ණයකරුගේ සම්පූර්ණ නම : පෝරුතොටගේ නෙල්සන් චන්ද්‍රසිරි ප්‍රනාන්දු සහ ජීවිත භුක්තිකරු කොළඹගේ විනිප්‍රීඩා ප්‍රනාන්දු.

නයිනමඩම ප්‍රසිද්ධ නොතාරිස් අයි. සී. කළුආරච්චි විසින් ලියා සහතික කරන ලද අංක 2226 හා 2003.10.03 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධිත) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස්දෙදහස් තුන්සිය අටයි ශත තිස්හතක (රු. 2,32,308.37) මුදලක් වර්ෂ 2006.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ එකොළොස් දහස් එකසිය හතයි ශත පනස් තුනක (රු. 2,11,107.53) මුදල ද වර්ෂ 2006.01.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිඑක්දහස් දෙසීයයි ශත අසූහතරක් (රු. 21,200.84) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ තිස්දෙදහස් තුන්සිය අටයි ශත තිස්හතක (රු. 2,32,308.37) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ එකොළොස් දහස් එකසිය හතයි ශත පනස් තුනක (රු. 2,11,107.53) මුදල මත අයවිය යුතු වර්ෂයකට 9.50% බැගින් වන පොළියක් 2006.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ මාර්තු මස 28 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, මාරවිල ලියාපදිංචි කොට්ඨාසයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාවේ බොරලැස්ස ග්‍රාමයෙහි පිරිස්වත්ත හෙවත් ගලවත්ත නමැති ඉඩමට 2003.06.13 දින වයි. එම්. ආර්. යාපා මානකතැන විසින් මැන සම්පාදිත අංක 8685 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට : PP/A 1692 හි ලොට් 107 ද, නැගෙනහිරට : PP/A 1692 හි ලොට් 101හි ලකුණු කරන ලද ප්‍රාදේශීය සභා පාර ද, දකුණට : PP/A 1692 හි ලොට් 105 ද, බස්නාහිරට : PP/A 1692 හි ලොට් 108 යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් අටක් (අ. 0, රූ. 1, පර්. 8) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේ ද මාර්ග පරවශතාවය ද සමඟ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පුත්/වෙන්/45/82 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

සාමාන්‍යාධිකාරී.

07-120

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 19/0/00/01136.

ණයකරුගේ සම්පූර්ණ නම : හතුරුසිංහ දේවගේ ගාමිණී ජයලත්.

නයිනමඩම ප්‍රසිද්ධ නොතාරිස් අයි. සී. කලුආරච්චි විසින් ලියා සහතික කරන ලද අංක 753 හා 1998.03.25 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස් හය දහස් එකසිය හැට තුනයි ශත තිස් හතක (රු. 1,56,163.37) මුදලක් වර්ෂ 2002.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හත් දහස් පහලොවයි ශත විසිපහක (රු. 1,07,015.25) මුදල ද වර්ෂ 2002.06.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතලිස් නව දහස් එකසිය හතලිස් අටයි ශත දොළහක් (රු. 49,148.12) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ පනස් හය දහස් එකසිය හැට තුනයි ශත තිස් හතක් (රු. 1,56,163.37) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හත් දහස් පහලොවයි ශත විසිපහක (රු. 1,07,105.25) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. අයි. ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කොට්ඨාසයේ දකුණු කටුගම්පල කෝරළේ, කටුගම්පල හත්පත්තු තලාහිටිමුල්ල පිහිටි හික්ගහමුලවත්ත හා හුරිගහමුලවත්ත නමැති ඉඩම 1997.05.16 දින වයි. එම්. ආර්. යාපා මානකතැන විසින් සැකසූ අංක 5506 පිඹුර ප්‍රකාර කැබලි 3ට මායිම්, උතුරට : කැබැලි 2 (ඉහත පිඹුර පරිදි) ද, නැගෙනහිරට :

ඇල ද, දකුණට : කැබලි 4 ඉහත පිඹුර පරිදි ද, බස්නාහිරට : පාර (ප්‍රාදේශීය සභා) යන මායිම් තුළ පිහිටි රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) වපසරියකින් යුතු වූ ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ. 136/265හි ලියාපදිංචි කරන ලදී.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

වර්ෂ 2002ක් වූ අගෝස්තු මස 30 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

07-123

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1900000868.

ණයකරුගේ සම්පූර්ණ නම : බෝහිංගම මුදියන්සේලාගේ ජයතිලක.

කටුනේරිය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. එච්. දාබරේරා විසින් ලියා සහතික කරන ලද අංක 127 හා 1997.07.10 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් අනූදෙදහස් හයසිය හතරයි ශත විසිදෙකක (රු. 92,604.22) මුදලක් වර්ෂ 2002.06.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස්හත්දහස් හාරසිය හතරයි ශත අසූවක (රු. 57,404.80) ද වර්ෂ 2002.06.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්පන්දහස් එකසිය අනූනවයයි ශත හතළිස් දෙකක් (රු. 35,199.42) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අනූදෙදහස් හයසිය හතරයි ශත විසිදෙකක (රු. 92,604.22) ද,

(2) එකී රුපියල් පනස්හත්දහස් හාරසිය හතරයි ශත අසූවක (රු. 57,404.80) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17% බැගින් වන පොළියක් 2002.07.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරන ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ලියාපදිංචි කොට්ඨාසයේ කුමාරවන්නි පළාතේ, පන්ඩිතපත්තුවේ තට්ටේව ගමේ පිහිටි පලුගහහේන නමැති ඉඩමට 1986.01.30 දින ඒ. ඊ. විජේසූරිය මානකතැන විසින් මැන සාදිත අංක 2455 දරන පිඹුරේ අංක 35 දරන කොටසේ උතුරට : මෙම පිඹුරේම කැබලි අංක 38 සහ 39 ද, නැගෙනහිරට : කැබලි 36, දකුණට : කැබලි 34 ද, බස්නාහිරට : පාරක් සඳහා වෙන් කර ඇති කැබලි 40 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම මාර්ග පරවශතාවයන් සමඟ වේ. මෙම ඉඩම පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී එස් 49/37හි ලියාපදිංචි කරන ලදී.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

වර්ෂ 2002ක් වූ අගෝස්තු මස 30 වැනි දින දී ය.

සාමාන්‍යාධිකාරී.

07-121

---

## සේලාන් බැන්ක් පීඑල්සී (ලියාපදිංචි අංකය : පීක්‍යු 9)-මිලේනියම් ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සේලාන් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සේලාන් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.05.24 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0860-040744-001

සේලාන් බැන්ක් පීඑල්සී නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. කුගදරන් විසින් සහතික කරන ලද 2004.10.26 දිනැති අංක 635 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොලොන්නාව, අයිඩීඑච් පාර, අංක 300හි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලියාපදිංචි අංක එන්(පීවීඑස්) 30106 දරන යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඒසී පුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී/උකස්කරු වශයෙන් රුපියල් එකසිය විසිතුන් ලක්ෂ හතළිස් හයදහස් හත්සිය දොළහයි ශත හැට හතරක (රු. 1,23,46,712.64) මුදලක් 2006 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සේලාන් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,23,46,712.64 මුදල ද, 2007 ජනවාරි මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 635 දරන බැඳුම්කරය මගින් සේලාන් බැන්ක් පීඑල්සී වෙත උකස්කර ඇත්තතාවූ මෙහි පහත

සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සේලාන් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### 1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ, අඹතලෙන් පහළ කොළොන්නාව නගර සභා සීමාව තුළ එගොඩ කොළොන්නාව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඒ. රූබසිංහ විසින් සාදන ලද 1952.11.03 දිනැති අංක 418 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලියනගහවත්ත සහ දෙල්ගහවත්ත නමැති ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර, සහ සවි කළ ද්‍රව්‍ය සහ උපකරණ සමග ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩමේ විජය පාර වරිපනම් අංක 68 (කොටසක්) දරන කැබලි අංක 6 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : රජයේ ඉඩම ද, නැගෙනහිරට : පාර ද, දකුණට : කැබැලි අංක 5 සහ බස්නාහිරට : කැබැලි අංක 7 ද යන මායිම් තුළ එකී අංක 418 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් දහඅටයි දශම පහක් (අ. 0. රූ. 1, පර්. 18.5) විශාල ඉඩම. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 903/12 යටතේ ලියාපදිංචි කර ඇත.

### 2 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ, අඹතලෙන් පහළ කොළොන්නාව නගර සභා සීමාව තුළ එගොඩ කොළොන්නාව පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඒ. රූබසිංහ විසින් සාදන ලද 1952.11.03 දිනැති අංක 418 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලියනගහවත්ත සහ දෙල්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 7 (පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : විජය පාර ද, නැගෙනහිරට : කැබලි අංක 6, 5 සහ 4 ද, දකුණට : කැබැලි අංක 4 සහ බස්නාහිරට : කැබලි අංක 3, 2 සහ 1 ද යන මායිම් තුළ පෙර කී අංක 418 දරන සැලැස්ම අනුව පර්චස් දහ හතක් (අ. 0, රූ. 0, පර්. 17) විශාල ඉඩම. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 890/46 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -නීති.

07-67

---

## සීමාසහිත සෙලාන් බැංකුව-මාතලේ ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.04.16 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0380-1232990-001.

"සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එස්. පරමසෝදි විසින් සියල්ලම සහතික කරන ලද 2003 දෙසැම්බර් 11 දිනැති අංක 1306, 1308 සහ 1310 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මාතලේ පදිංචි අබ්දුල් අසීස් මොහමඩ් සුල්තාන් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසිහය ලක්ෂ හයදහස් හත්සිය පනස්පහයි ශත අනූ දෙකක (රු. 26,06,755.92) මුදලක් 2006 අප්‍රේල් මස 17 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 26,06,755.92 මුදල ද, 2006 අප්‍රේල් මස 18 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී 1306, 1308 සහ 1310 දරන බැඳුම්කර මගින් මෙහි පහත සඳහන් 1 වැනි, 2 වැනි සහ 3 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.".

### 1 වැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ ගම්පහ සියපත්තුවේ උඩුගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. රාජසේකරන් විසින් සාදන ලද 2000.12.10 දිනැති අංක 5272 දරන සැලැස්මේ සඳහන් නිකවෙල එස්ටේට් නමැති ඉඩමෙන් කැබලි අංක 1 සිට 8 ලෙස පෙන්නුම් කරනු ලබන යාබද ඉඩම් කැබලිවලට මායිම්, ඊසානට : ප්‍රධාන පාරට යන එස්ටේට් පාර ද, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නිරිතට : කාණුව සහ බස්නාහිරට : එස්ටේට් පාර ද යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් විසි හතයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 3, පර්. 27.50) විශාල එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම.

### 2 වැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ ගම්පහ සියපත්තුවේ උඩුගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. රාජසේකරන් විසින් සාදන ලද 2000.12.13 දිනැති අංක 5273 දරන සැලැස්මේ සඳහන් නිකවෙල එස්ටේට් නමැති ඉඩමෙන් කැබලි අංක 1 සිට 8 සහ 10 සිට 11 ලෙස පෙන්නුම් කරනු ලබන යාබද ඉඩම් කැබලිවලට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට සහ ගිණිකොණට : එකී සැලැස්මේ සඳහන් කැබලි අංක 9, එස්ටේට් පාර සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නිරිතට සහ බස්නාහිරට : එස්ටේට් පාර ද යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් පහළොවයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 3, පර්. 15.50) විශාල එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම.

### 3 වැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ ගම්පහ සියපත්තුවේ උඩුගම පිහිටි බලයලත් මිනින්දෝරු එම්. රාජසේකරන් විසින් සාදන ලද 2000.12.19 දිනැති අංක 5274 දරන සැලැස්මේ සඳහන් නිකවෙල එස්ටේට් නමැති ඉඩමෙන් කැබලි අංක 1 සිට 4 ලෙස පෙන්නුම් කරනු ලබන යාබද ඉඩම් කැබලි වලට මායිම් ඊසානට : කාණුව ද, දකුණට, ගිණිකොණට සහ

නිරිතට : එස්ටේට් පාර ද යන මායිම් තුළ රුඩ් එකයි, පර්චස් විසිහයයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 1, පර්. 26.60) විශාල එහි පිහිටි සියලු දේ සමඟ ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -නීති.

07-69

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - කුරුණෑගල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007 මැයි මස 24 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 2002.09.04 දිනැති සහ අංක 176 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නිස්සංක ආරච්චිගේ වික්‍රම නිස්සංක ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ තිස්පන්දහස් එකසිය පනස් හතර (රු. 4,35,154) ක මුදලක් 2007.04.30 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 4,35,154ක මුදලට 2007.05.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 176 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපොළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වෙයුදවිල්ලු හත්පත්තුවේ මීගොඩ කෝරලේ, මහගල්ගොඩ, මිල්ලැව ගමේ පිහිටි "බණ්ඩාරවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එම්. ඩබ්. ආරියරත්න විසින් මැන සාදන ලද 1998.05.30 දිනැති අංක 98/279 දරන පිඹුරේ ලොට් අංක 7 ලෙස නිරූපිත බෙදා වෙන් කර සලකුණු කර ඇති ඉඩම් කොටසට උතුරට : මෙම පිඹුරේම ලොට් 4, 5, 6, 6ඩී4, සහ 6ඩී3, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : අංක 1491 දරන පිඹුරේ ලොට් 78 සහ 74න් ද, බස්නාහිරට : අංක 1491 දරන පිඹුරේ ලොට් 77න් ද, මායිම් වූ පර්චස් දහඅටයි දශම හයයි (අ. 0, රූ. 0, පර්. 18.6)ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියළු දේත් හා බලයලත් මානක එම්. ඩබ්. ආරියරත්න විසින් මැන සාදන ලද අංක 98/279 දරන පිඹුරේ ලොට් 6සී සහ 6ඩී4 මතින් හා දිගට මාර්ග අයිතිය ද සමඟ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1431/177 වෙළුමේ හා පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.



ඉහත කී ලොට් 7 දරන ඉඩම බලයලත් මානක එම්. ඩබ්. ආරියරත්න විසින් මැන සාදන ලද අංක 115/2002 දරන පිඹුරේ මෙසේ විස්තර කර ඇත :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හත්පත්තුවේ වෙයුදවිල්ලි, මීගොඩ කෝරලේ, මහගල්ගොඩ, මිල්ලැව ගමේ පිහිටි "බණ්ඩාරවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට ඉහත කී පිඹුරට අනුව බෙදා වෙන් කර සලකුණු කරන ලද ලොට් 1 නැමැති ඉඩම් කැබැල්ල, උතුරට : ලොට් 4, 5, 6, 6ඩී3, සහ 6ඩී4 නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : බලයලත් මානක ඩබ්. ඩී. බී. රෙජිනෝල්ඩ් විසින් මැන සාදන ලද අංක 1491 දරන පිඹුරේ ලොට් 74 සහ ලොට් 78න් ද, බස්නාහිරට : බලයලත් මානක ඩබ්. ඩී. බී. රෙජිනෝල්ඩ් විසින් මැන සාදන ලද අංක 1491 දරන පිඹුරේ ලොට් 77න් ද, මායිම් වූ පර්චස් දහඅටයි දශම හයයි (අ. 0, රූ. 0, පර්. 18.6) ක් විශාල ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

07-135/3

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - මොණරාගල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007 මැයි මස 24 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දා වූ 1999.11.10 දින සහ 2000.09.20 දිනැති සහ පිළිවෙලින් අංක 7201 සහ 7952 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුවන්ද හෙන්නැදිගේ පියසේන ද සිල්වා ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් තිස්හතර ලක්ෂ හැටදහස් තුන්සිය තිස්දෙකයි ශත තිස්හතර (රු. 34,60,332.34) ක මුදලක් 2006.08.31 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 34,60,332.34ක මුදලට 2006.09.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 7201 සහ 7952 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දෙප්ළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, බුත්තල, වැදිරට කෝරලේ, බුත්තල, මුප්පන, මොණරාගල නගරයේ පිහිටි

"එගොඩවත්තහේන" නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බෙදා වෙන් කරන ලද ඉඩමේ කොටස වන මොණරාගල දිස්ත්‍රික් උසාවියේ 261 දරන නඩුවේ ගොණු කර ඇති සහ බලයලත් මානක එච්. ටී. ඕරන්ස් විසින් මැන සාදන ලද 1970.11.06 දිනැති අංක 699 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 ලෙස නිරූපිත ඉඩම් කොටසට, උතුරට : එම්. බී. ධර්මදාස සහ අනිත් අයට අයිති ඉඩම් වෙන් කෙරෙන ඉනි වැටෙන් සහ කම්බි වැටෙන් ද, නැගෙනහිරට : එම්. බී. ධර්මදාසට අයිති ඉඩම හා තාප්පය වෙන් කෙරෙන ඉනි වැටෙන් සහ කම්බි වැටෙන් ද, දකුණට : කුමාර දොල පාරෙන් සහ බස්නාහිරට : ලක්ෂ්මන් සිල්වාට අයිති ඉඩම වෙන් කෙරෙන ඉනි වැටෙන් සහ කම්බි වැටෙන් ද මායිම් වූ පර්චස් දහඅටයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 18.60) විශාලත්වය සහිත ඉඩම සහ ඒ තුළ පිහිටි සියළු දේත් සමග මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් 32/266 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණී ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මණ්ඩලයේ ලේකම්.

07-135/2

---

## මහජන බැංකුව - දංකොටුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.05.19 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුචිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2005.08.23 දිනැති අංක 3055 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කුඹලාතර ආරච්චිලාගේ දොන් මහේෂ් කුමාර් පොතුවිල සහ කුඹලාතර ආරච්චිලාගේ දෝන අනෝමා ශිරාමනි පොතුවිල යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දහතුන් ලක්ෂ පනස් එක් දහස් හයසිය හැත්තෑ නවයයි ශත අනූ පහ (රු. 13,51,679.95) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2006.03.05 දින සිට වර්ෂයකට 16.5% බැගින්, රුපියල් දහතුන් ලක්ෂ පනස් එක් දහස් හයසිය හැත්තෑ නවයයි ශත අනූ පහ (රු. 13,51,679.95) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව, එකී රුපියල් දහතුන් ලක්ෂ පනස් එක් දහස් හයසිය හැත්තෑ නවයයි ශත අනූ පහ (රු. 13,51,679.95) ක මුදල අයකර ගැනීම සඳහා මීගමුව බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එකී අංක 3055 දරන උකස්කරය යටතේ, එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කොට්ඨාසයට අයත් දකුණු පිටිගල් කෝරලේ, ඕතර පළාතේ, නැගෙනහිර කිරිමැටියාන නමැති ගමේ පිහිටි මීගහවත්ත නමැති ඉඩමට වයි. එම්. රංජිත් යාපා, බලයලත් මානක තැන විසින් 2001.12.11 දින මැන සාදන ලද අංක 7847 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන ඉඩමට මායිම්, උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : උපාලි ජයසිංහගේ ඉඩම ද, දකුණට : ඇල ද, බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසද යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි, පර්චස් තිස් නවයයි දශම හත (අක්. 00, රූඩ් 00, පර්. 39.7) ක් විශාල ඉඩම් බිම සහ ඒ තුල පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි යනාදී සැම සියලු දේද වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 94/60 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
හලාවත.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

07-97

---

## සීමාසහිත සෙලාන් බැංකුව - විදේශ මුදල් බැංකු ඒකකය

### 1990 අංක 4 බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අප්‍රේල් මස 16 වන දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 9911-089882-001.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් සහතික කරන ලද 1999.07.09 දිනැති අංක 1910 දරන උගස්කරය සහ සෙලාන් බැංකුව නමට ලියන ලද 1999.06.24 දිනැති යන්ත්‍ර සූත්‍ර උගස්කර අංක එෆ්සීබියූ/එම්එම්/990003 සහ 2003.12.31 දිනැති අංක එෆ්සීබියූ/එස්එම්/03/021 දරන උකස්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 11හි සිට ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලියාපදිංචි අංක එන් (පීවීස්) 5213 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන කොස්මොස් මැකී ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් යන සමාගම බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ ඇමරිකන් ඩොලර් 2,99,027.88 ක මුදලක් 2004 ජනවාරි මස 30 වන දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ඇමරිකන් ඩොලර් 299,027.88 ක මුදල ද 2004 ජනවාරි මස 31 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට පිළිවෙලින් වර්ෂයකට සියයට නවය (9%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී

අංක 1910, සහ අංක එෆ්සීබීයූ/එම්එම්/990003 සහ අංක එෆ්සීබීයූ/එස්/එම්/03/021 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උගස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ, පරිශ්‍රය සහ යන්ත්‍ර සූත්‍ර බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාර්ට් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

## පළමු උපලේඛනය

1. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ දාසිය පත්තුවේ ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ කටුනායක-සීදූව උපකාර්යාල සීමාව තුළ දකුණු කදිරාන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1985 ජුලි මස 12 දිනැති අංක 1230 දරන සැලැස්මේ සඳහන් කදිරානවත්ත නමැති ඉඩමේ කැබලි අංක 1 ලකුණු කළ (මහ කොළඹ ආර්ථික කොමිසමේ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ අංක පීසීරීසී/අයිජීඉසෙඩ්/කේ/003 දරන සිතියමේ අදියර 1 පසුතල සැලැස්මේ සීඑම්අයිඑල් කැබැල්ල සේ පෙන්නුම් කරනු ලබන ඉඩමේ මැනීමක් හා අතුරු බෙදීමක් වන) ඉඩම් කොටසට මායිම්, උතුරට : මහ කොළඹ ආර්ථික කොමිසමට අයිති ඉඩම සහ කැබලි අංක 3 මෙහි සඳහන් (මීටර් 5 ක් පළල පාර සඳහා වෙන් කිරීම), නැගෙනහිරට : මෙහි සඳහන් කැබලි අංක 2 ද, දකුණට : මහ කොළඹ ආර්ථික කොමිසමට අයිති ඉඩම සහ කැබලි අංක 3 මෙහි සඳහන් (මීටර් 5 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද සහ බස්නාහිරට : රිං රෝඩ් 11 සහ වෙන් කළ ඉඩම යන මායිම් තුළ එකී අංක 1230 දරන සැලැස්ම අනුව අක්කර එකයි, රූඩ් දෙකයි, පර්චස් දහයයි දශම දෙකක් (අ.1, රූ. 2, පර්.10.2) විශාල ඉඩම.

පෙර කී අංක 1230 දරන සැලැස්මේ සඳහන් එකී අංක 1 කැබැල්ල පහත සඳහන් ඉඩමෙන් බෙදා වෙන් කළ කොටසක් වේ :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචිකිරීමේ කොට්ඨාසයේ, දාසිය පත්තුවේ කටුනායක -සීදූව සුළු නගර සභා සීමාව තුළ දකුණු කදිරාන ගමේ පිහිටි මහ කොළඹ ආර්ථික කොමිසමේ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ සිතියම් අංක පීසීරීසී/අයිජීඉසෙඩ්/කේ/003 හි පෙන්නුම් කරනු ලබන අදියර 1 පසුතල සැලැස්මේ සඳහන් කදිරානවත්ත නමැති ඉඩමේ සීඑම්අයිඑල් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට, ගිණිකොනට සහ නිරිතට : මිනුම්පති විසින් සාදන ලද 1978 මාර්තු 02 දිනැති අංක කේඕ/ඒ/78/26 Rev.4 ඇඩ්වාන්ස් ට්‍රේසිං හි සඳහන් මහ කොළඹ ආර්ථික කොමිසමට අයිති ඉඩම් සහ වයඹට : රිං රෝඩ් 11 ද යන මායිම් තුළ එකී අංක පීසීරීසී/අයිජීඉසෙඩ්/කේ/003 දරන සිතියම අනුව අක්කර දෙකයි, රූඩ් දෙකක් (අ. 2, රූ. 2, පර්. 0) විශාල ඉඩම.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සී 686/82 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ දාසිය පත්තුවේ, ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ, කටුනායක-සීදූව උපකාර්යාල සීමාව තුළ කදිරාන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1985 ජුලි 12 දිනැති අංක 1230 දරන සැලැස්මේ සඳහන් කදිරානවත්ත නමැති ඉඩමෙන් කැබලි අංක 2 ලකුණු කළ (මහ කොළඹ ආර්ථික කොමිසමේ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ අංක පීසීරීසී/අයිජීඉසෙඩ්/කේ/003 දරන සිතියමේ අදියර 1 පසුතල සැලැස්මේ සීඑම්අයිඑල් කැබැල්ල සේ පෙන්නුම් කරනු ලබන ඉඩමේ මැනීමක් හා අතුරු බෙදීමක් වන) ඉඩම් කොටසට මායිම් උතුරට, නැගෙනහිරට සහ දකුණට : මහ කොළඹ ආර්ථික කොමිසමට අයිති ඉඩම, බස්නාහිරට :කැබලි අංක 1, අංක 3 (මීටර් 5 ක් පළල පාර සඳහා වෙන් කිරීම), යන මායිම් තුළ එකී අංක 1230 දරන සැලැස්ම අනුව රූඩ් තුනයි, පර්චස් දහතුනක් (අ. 0, රූ. 3, පර්.13) විශාල ඉඩම.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සී 626/288 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් තුළ උඩින්, යටින් සහ දිගේ පූර්ණ සහ නිදහස් අයිතිය, ස්වාධීනත්වය සහ බලය සහිත මාර්ග අයිතිය සහ මාර්ගය පාවිච්චි කරන්නෙකුට ඇති අනිකුත් සියලු අයිතිවාසිකම් සමග.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, දාසිය පත්තුවේ, ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ, කටුනායක-සීදූව උපකාර්යාල සීමාව තුළ කදිරාන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1985 ජුලි 12 දිනැති අංක 1230 දරන සැලැස්මේ සඳහන් කදිරානවත්ත නමැති ඉඩමෙන් කැබලි අංක 3 ලකුණු කළ (මාර්ගය සඳහා වෙන් කිරීම) (මහ කොළඹ ආර්ථික කොමිසමේ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ අංක පීසීරීසී/අයිජීඉසෙඩ්/කේ/003 දරන සිතියමේ අදියර1 පසුතල සැලැස්මේ සීඑම්අයිඑල් කැබැල්ල සේ පෙන්නුම් කරනු ලබන ඉඩමේ මැනීමක් හා අතුරු බෙදීමක් වන) ඉඩම් කොටසට මායිම්, උතුරට: කැබලි අංක 1 ද, නැගෙනහිරට : කැබලි අංක 2 ද, දකුණට : කැබලි අංක 1 සහ බස්නාහිරට : රිං රෝඩ් 11 සහ වෙන් කළ ඉඩම යන මායිම් තුළ එකී අංක 1230 දරන සැලැස්ම අනුව පර්චස් දහසයයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 16.8) විශාල ඉඩම.

මෙය මීගමුව ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සී 626/289 යටතේ ලියාපදිංචි කර ඇත.

## දෙවෙනි උපලේඛනය

මැෂින් වර්ගය
මාදිලිය
මැෂින් අංකය

| *අයිතම අංකය* | *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| *මහන මැෂින්* : | | |
| බී2 | ජුකී - 357 | 12 |
| ඩී1 | එම්ඕ - 357 | 08 |
| ඊ2 | එල්බීඑච් - 780 | 01 |
| ඊ3 | එල්කේ -1850 | 02 |
| ඊ4 | ඩීඑෆ්ජ් බී -1404 | 01 |
| ඊ6 | ඩීඩීඑල් -555 | 90 |
| ඊ7 | එම්ඕ -25165 | 11 |
| ඊ9 | 373 | 01 |
| ඊ10 | එල්කේ -1850 | 03 |
| ඊ16 | බීඩීඑල් - 555 | 11 |
| ඊ17 | එල්එච් - 515 | 16 |
| ජී1 | එම්ඕ - 747 | 07 |
| කේ 1 | එම්ඕ - 2366ඊ | 08 |
| කේ 2 | බී - 832 | 06 |
| කේ 6 | එල්එච් - 162 | 02 |
| කේ 13 | බී 8423 | 06 |
| එල් 2 | එෆ්ජ්ර්ඩී ටී 2-240 | 19 |
| එල් 3 | බී 832 | 20 |
| එන් 5 | ඩීටී2-බී925 | 10 |
| එන් 7 | ඩීඑල්කේ-800 | 23 |
| පී 3 | එල්කේ-1850 | 05 |
| පී 4 | ඩීඑන්එෆ්ජ් 500 | 29 |
| පී 5 | ඩීඑන්ටී-860 | 01 |
| පී 6 | එල්ටී2-240 | 09 |
| එස් 1 | බීඩී2-එච් 310 | 20 |
| එස් 2 | කේඑම්-506 | 5 |

| *අයිතම අංකය* | *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| ටී 1 | එල්කේ3-බී434ඊඑක්ස් | 3 |
| *වෙනත් වර්ග :* | | |
| ඒ 9 | මෙට්ල් බටින් ප්‍රෙස් | 10 |
| බී 1 | ස්ට්‍රැපින් මෙෂින් | 1 |
| බී 6 | බටින් ප්‍රෙස් | 5 |
| සී 1 | ජෙනරේටර් | 1 |
| ජේ 3 | fපියුසිං මැෂින් | 1 |
| කේ 5 | අන්ඩර් ට්‍රිමිං අවුටිං ස්ටිච් | 1 |
| කේ 11 | ඊස්ට්මන් කටිං | 2 |
| එල් 5 | බැන්ඩ් නයිfප් මැෂින් | 1 |
| කිව් 1 | කටිං මැෂින් | 1 |
| ආර් 1 | ඩීසල් බොයිලර් | 1 |
| ටී 3 | ඩීසල් බොයිලර් | 1 |

### තුන්වෙනි උපලේඛනය

පහත සඳහන් ද්‍රව්‍යවලින් සමන්විත ව්‍යාපාර බඩු තොග නිම වූ සහ නොනිමි භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ අනෙකුත් ද්‍රව්‍ය වෙන් වෙන්ව සහ එක්ව.

අමුද්‍රව්‍ය, උපාංග, ප්‍රගමන වැඩ, නිමි භාණ්ඩ.

අමුද්‍රව්‍ය, උපාංග, ප්‍රගමන වැඩ, නිමි භාණ්ඩ සහ ලීබඩු, සවිකිරීම් සහ වෙනත් සෑම වර්ගයක සහ ඕනෑම ආකාරයක හෝ විස්තරයක චංචල දේපළ (මෙහි මින්මතු පහත සඳහන් වරිපනම් අංක දරන පරිශ්‍රයන්හි තිබෙන බන්ධනදායීගේ ව්‍යාපාර බඩුතොග ද්‍රව්‍ය, නිමවූ සහ නොනිමි භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලබන)

1. අංක 241 ලෙයාර්ඩ් බ්‍රෝඩ් වේ, කොළඹ 14 ;
2. අංක 80, මහා විද්‍යාල මාවත, කොළඹ 13 ; සහ
3. අංක 01 රිං රෝඩ්, බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය

සහ බන්ධනදායී දැනට සිටින හෝ ඕනෑම වේලාවක සහ මින්මතු කලින්කලට පෙර කී දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සියලු ගුදම් ගබඩා සහ පරිශ්‍රයන්හි හෝ බන්ධනදායීගේ ව්‍යාපාර බඩු තොග, ද්‍රව්‍ය, නිමවූ සහ නොනිමි භාණ්ඩ සහ ඕනෑම මාදිලියක සහ විස්තරයක චංචල දේපළ මෙම බන්ධනය පවත්නා කාලය තුළ මින්මතු කලින්කලට සහ සියලු අවස්ථාවන්හි ගෙන එනු ලැබිය හැකි හෝ බහා තබන හෝ ව්‍යාපාර කටයුතු සඳහා හෝ අලෙවිය හෝ ගබඩා කිරීම සඳහා බන්ධනදායීගේ ව්‍යාපාර බඩුතොග, ද්‍රව්‍ය, නිමි සහ නොනිමි භාණ්ඩ සහ වෙනත් චංචල දේපළ ආදිය මින්මතු ඕනෑම වේලාවක සහ කලින් කලට ගෙනයනු ලබන සියලු හෝ වෙනත් ස්ථානයක් හෝ ස්ථානයන්.

II

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුළ කොළඹ වරායේ වාප්පුවල සහ ගුදම්වල ඇති (මෙහි මින්මතු ඒ සියල්ලම බන්ධනදායීගේ වරායේ ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හැඳින්වේ)

අමුද්‍රව්‍ය සහ උපාංග, ප්‍රගමන වැඩ, නිමි භාණ්ඩවලින් සැදුම්ලත් ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ සෑම වර්ගයකම සියලු වෙනත් භාණ්ඩ සාමූහිකව සහ තනි තනිව,

III

බස්නාහිර පළාතේ, මීගමුව දිස්ත්‍රික්කයේ කටුනායක ගුවන් තොටුපළේ ගබඩාවල සහ ගුදම්වල ඇති (මෙහි මින්මතු ඒ සියල්ලම බන්ධනදායීගේ ගුවන්තොටුපොළ ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හැඳින්වේ.)

අමුද්‍රව්‍ය සහ උපාංග, ප්‍රගමන වැඩ, නිමි භාණ්ඩ වලින් සැදුම්ලත් ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ සෑම වර්ගයකම සියලු වෙනත් භාණ්ඩ සාමූහිකව සහ තනි තනිව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

07-68

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.

4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතුය.

6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත ඩිපිටපතඩ් කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේයි :-

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 | 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | 1,008 | 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනයකම ධිශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයඞ් පළකරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.

13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව* :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ජෙද තුනම ඇතුළත්) | 1,612 | 0 | 2,098 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 | 0 | 745 | 0 |
| I වන ජෙදය | 520 | 0 | 1,007 | 0 |
| II වන ජෙදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 | 0 | 1,009 | 0 |
| III වන ජෙදය | 468 | 0 | 907 | 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 | 0 | 4,422 | 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

*තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ රු. | ශ. | තැපැල් ගාස්තුව (මෙරට) රු. | ශ. |
|---|---|---|---|---|
| (අ) I වන කොටස | 31 | 0 | 5 | 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 11 | 0 | 5 | 0 |
| (ආ) I වන ජෙදය | 10 | 0 | 5 | 0 |
| II වන ජෙදය | 12 | 0 | 5 | 0 |
| III වන ජෙදය | 9 | 0 | 5 | 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේම පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ 01, ලෝටස් පාර, අංක 32හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.**

*සැළකිය යුතුයි.-* මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2007** | | | |
| ජූලි | 2007.07.06 | සිකුරාදා | 2007.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.13 | සිකුරාදා | 2007.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.20 | සිකුරාදා | 2007.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.07.27 | සිකුරාදා | 2007.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2007.08.03 | සිකුරාදා | 2007.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.10 | සිකුරාදා | 2007.07.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.17 | සිකුරාදා | 2007.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.24 | සිකුරාදා | 2007.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.08.31 | සිකුරාදා | 2007.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2007.09.07 | සිකුරාදා | 2007.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.14 | සිකුරාදා | 2007.08.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.21 | සිකුරාදා | 2007.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2007.09.28 | සිකුරාදා | 2007.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.